**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2021**

---

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශ තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතිවලට වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇතිබව මා දරන්නාවූ මතයවේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ

වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරනය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශ වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සභාව ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස , කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම,අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම,කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම,සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතු භාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් " මනා ලෙස සැලසුම් කරන ලද " අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සඳහා ප්‍රධාන ගිණුම්කරණ වාර්තා ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 1368/18 හා 2004 නොවැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම සභාව වෙත රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කර තිබූ රු.51,719,745 ක් වූ සියයට 02 හි දායකත්වය පිළිබඳ නිවැරදිතාවය තහවුරු වන රක්ෂණ සමාගම්හි කොමිස් ආදායම් ගණනය කිරීම් විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සියලු රක්ෂණ ආයතන සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරමින් පවතින බව. | ආදායම් හඳුනාගෙන නිසි පරිදි ගිණුම්ගත කල යුතුවේ. |

**1.6 නීති රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.<br>4.2.6 වගන්තිය | කාර්තු, අර්ධවාර්ෂික, වාර්ෂික වශයෙන් ආයතනයේ කාර්යසාධන | පිළිතුරු ලබා දී නොමැත. | අදාල චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විය යුතුවේ. |

වාර්තා සමාලෝචනය කලයුතු වුවද සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 25,998,075 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 61,863,867 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.35,865,792 ක අඩුවීමක් නිරීක්ෂණය විය.රු. 61,429,545 ක් වූ ඉකුත් වර්ෂයේ අතිරික්තයට කරන ලද සංශෝධන හේතුවෙන් හා සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අරමුණු මුදුන්පමුණුවා ගැනීම සඳහා වූ ප්‍රාග්ධන වියදම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.35,865,792 කින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1998 අංක 05 දරණ මොටර් වාහන පනතින් සංශෝධිත පනතේ (203 වන අධිකාරිය ) මගින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපනය කිරීම අරමුණු කොටගෙන ජාතික සභාව පිහිටුවා වසර 15 ක් ගත වී ඇතත් කොමිෂමක් ලෙස ස්ථාපිත නොවීම හේතුවෙන් මෙම සභාවේ කාර්යයන් ඉටුකිරීමට නීතිමය බලතල ලැබී නොතිබුණු අතර විධිමත් කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට එය බාධාවක්ව තිබුණි. | අදාල පනත් කෙටුම්පත ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමා විසින් සංශෝධන ඇතුලත් කර 2022.05.23 නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත යවන ලදී. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපනය කිරීමට පියවර ගත යුතුවේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 1387/4 හා 2005 අප්‍රේල් 04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පවරා තිබූ කාර්යය වලින් රථ වාහන ප්‍රමාණය ඒවායේ ලක්ෂණ හා සංයුතිය, මාර්ග අනතුරු හා මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා තොරතුරු ඇතුලත් | මේ පිළිබඳ 2021-16/05-09 දරණ සභා පත්‍රිකාව 2021.08.06 දින පැවති මහ සභා රැස්වීමට ඉදිරිපත් කල අතර මෙම කර්තව්‍ය සිදුකරන වෙනත් ආයතන ඇති බැවින් | සැලසුම් ප්‍රකාරව කටයුතු කලයුතුවේ. |

| | | |
|---|---|---|
| පරිගණක දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම,මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාම, සම්බන්ධිත විෂයයන් පිළිබඳ පර්යේෂණවලට ආධාර කිරීම,සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතා පැවත්වීම දැනුම හුවමාරු කර ගැනීම,මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම,රජය හා රාජ්‍ය නොවන සංවිධාන තුල මාර්ග ආරක්ෂාව සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සහ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් ලබාදීම යන කාර්යයන් ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | ඒවා සම්බන්ධ කරගෙන මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ විද්‍යුත් පුස්තකාලය හරහා මෙම දත්ත වලට ප්‍රවේශ වීමට පිවිසුමක් සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කිරීමට සභාවේ යෝජනා විය. | |
| සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ ආයතනවලින් රු. 51,719,745 ක දායක මුදල් ලැබී තිබූ අතර ඉන් රු.6,375,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණු එම මුදල ලැබීම්වලින් සියයට 13 ක් විය. ශ්‍රී ලංකාව තුල සිදුවන වාහන අනතුරු සඳහා වන්දි මුදල් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳව මහජනතාවගේ නොදැනුවත්භාවය හේතු වී තිබුණි. | පසු ගිය වර්ෂ 06 තුල හප්පා පලාගිය අනතුරු සංඛ්‍යාව 353 ක් වන අතර ඉන් 322 ක අයදුම්පත් 2021.12.31 වන විට ලැබී ඇති අතර එය සියයට 91 ක ප්‍රතිශතයකි.එයින් අයදුම් පත් 268 ක් සඳහා මේ වන විටත් වන්දි ගෙවා ඇත. එසේම වන්දි ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 2021 කොරෝනා වසංගතය නිසා ක්‍රියාත්මක නොවූ වැඩසටහන් 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත. | වන්දි ලබා දීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සිදු කල යුතුවේ. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල ,පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් මස ජපන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ හා මිලදී ගෙන තිබූ රු. 5,875,351 ක් වටිනා රියැදුරු පුහුණු උපකරණ වලින් රියැදුරු පුහුණු කිරීම් සාර්ථකව සිදුකර නොතිබූ අතර 2019 ජූනි 21 දිනෙන් පසු පුහුණු කටයුතු නවතා දමා තිබීම හේතුවෙන් එම උපකරණ නිශ්කාර්යව පැවැතුණි. | ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියදුරු පුහුණු පාසැල් සඳහා එම උපකරණ ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අවශ්‍යතා හඳුනාගෙන පවත්නා වත්කම් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කලයුතුවේ. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් හා අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගත යුතු වුවද, සභාවේ කටයුතු ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත නිලධාරීන් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියෙකුගෙන් හා අනියම් කම්කරුවකුවන් යොදවා කරගෙන ගොස් තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ උපදෙස් පරිදි කාර්ය මණ්ඩලය අනුමත කරගැනීමට අදාල වාර්තා 2022.04.06 දින ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | සභාව සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගැනීමට කටයුතු කලයුතුවේ. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ගිණුම් කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ ජුලි මස සංශෝධිත අයවැය ලේඛනය හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර අධික වේගය නිසා සිදුවන මාර්ග අනතුරු අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණු නමුත් 2021 වර්ෂය සඳහා ප්‍රතිපාදනය කල රු.මිලියන 150 ක මුදල අදාල කාර්යයට යොදවා නොතිබූ බැවින් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. මේ හේතුවෙන් සභාව 2021 සඳහා සකස් කල සංශෝධිත අයවැය හා ක්‍රියාකාරී සැලැස්ම ඵලදායි පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.එසේම සභාව විසින් මාර්ග ආරක්ෂාව සඳහා නව ඵලදායි වැඩසටහන් හදුන්වා දී අනතුරු අවම කිරීමට නව යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කරනු වෙනුවට පෙර වර්ෂ වලට අදාල ක්‍රියාත්මක කිරීමට අපෙහොසත් වූ වැඩසටහන් හා | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර සකස් කර ඉදිරි වැඩ කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. | දිගින් දිගටම ඉටුකල නොහැකි මට්ටමේ කාර්ය භාරයක් වෙනුවට අත්‍යවශ්‍ය කාර්යන් සඳහා සැලසුම් සකස් කලයුතුවේ. |

ව්‍යාපෘති 2021 වර්ෂයේදී නැවතත් ක්‍රියාත්මක කර තිබුණි.

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1971 අංක 38 දරණ මුදල් පනතේ 8(1) වගන්තිය හා PED 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය ප්‍රකාර මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර මාස 03 කට ප්‍රථම අයවැය ලේඛනය අනුමත කල යුතු වුවත් සභාව විසින් අයවැය ලේඛනය අනුමත කර තිබුනේ 2021 ජනවාරි 13 දිනදීය. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුගත විය යුතු වේ. |

**4.3 තිරසර සංවර්ධන අරමුණු.**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක එන්පි/5පි/5ඩිජී/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | මා.ආ.පි.ජා.ස ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බැවින් ප්‍රවාහන අමාත්‍යාංශය මගින් සකසනු ලබන තිරසර සංවර්ධන සැලැස්මෙහි මා.ආ.පි.ජා. සභාවට අදාල යෝජනා අඩංගු කර ඇත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන සැලසුම් සකස් කලයුතුවේ. |